සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයන්හි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

01 මර ඇඳේ සිටිය සිරිපාල කියූ වදනට කාගෙත් සිත් කම්පා වුණි.
(1) මරලතෝනි දෙමින් (2) අන්තිම අවස්ථාවට පත් වෙමින්
(3) මාරයාගේ ඇඳෙහි නිදාගනිමින් (4) දැඩි රෝගයක පෙළමින්

02 ගුණපාල **හය හතර** නොදන්නා කෙනෙකු මෙන් හැසිරුණේ ය.
(1) ඉලක්කම් දන්නේ නොමැති (2) අධිෂ්ඨානයක් නොමැති
(3) තර්කානුකූලභාවයක් නොමැති (4) දැනුම් තේරුම් නොමැති

03 කිසිවක් කරගත නොහැකි වූ ඔහු **කරබා** ගෙන සිටියේ ය.
(1) නිශ්ශබ්දව (2) කර සහ අත අල්ලාගෙන
(3) දැඩි ආඩම්බරයට පත්ව (4) අසරණතාවයට ලක්ව

- **අංක 04 සිට 06 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04 'ජ' අක්ෂරය සිංහල භාෂාවෙහි ..................... යෙදේ.
(1) නිරන්තරයෙන් (2) සුලබ ව (3) විශේෂයෙන් (4) දුර්ලභව

05 වර්තමානයේ දී එළවළු මිල ..................... වෙමින් පවතියි.
(1) චංචල (2) උච්චාවචනය (3) ස්ථිර (4) පරිපූර්ණ

06 ඉංදීය ජනයා මෙරටට ..................... වීමට පෙර සිට ම මෙරට පැවති ගොවිතැන් ක්‍රමය වී ඇත්තේ හේන් ගොවිතැනයි.
(1) සංචරණය (2) ආක්‍රමණය (3) සංක්‍රමණය (4) සංචාරය

- **අංක 07 සිට 08 දක්වා සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.**

07 අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) ආගමනය, ආක්‍රමණය, ආචාර, ආධාර
(2) අභිමානය, අභිප්‍රාය, සම්ප්‍රදාය, අධම
(3) ඉතාලිය, ඉතියෝපියාව, රුසියාව, ශ්‍රී ලංකාව
(4) රිදී, රත්තරන්, තඹ, ඇලුමිනියම්

08 සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) කතා වින්‍යාශය, ප්‍රතිභාව, හේතුඵල සම්බන්ධතා, පිළිරුව
(2) නෂ්ටාවශේෂ, සන්තුෂ්ටිය, ප්‍රහර්ෂය, ධර්මිෂ්ඨ
(3) කණ්ඨජ අක්ෂර, අන්තඃස්තාක්ෂර, විශේෂ, පිළියෙළ
(4) විශ්මය, හසළත්වය, සුලළිත, පුස්ථකාලය

09 යංශය, රකාරංශය, රේඵය, ඇලපිල්ල අනුපිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.
(1) ත්‍යාගය, සම්ප්‍රදාය, වර්ණ, සාමාන්‍ය (2) ත්‍රස්තවාදය, ප්‍රයෝජන, තර්කය, කාවන්තිස්ස
(3) ව්‍යාපාර, සම්මන්ත්‍රණය, සංවර්ධනය, රැකවරණය (4) අභ්‍යන්තර, ආක්‍රමණය, වර්ගය, කාන්තාරය

10 ''කමතට'' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) කණ්ඨජ, මූර්ධජ හා දන්තජ ය. (2) කණ්ඨජ, ඕෂ්ඨජ හා දන්තජ ය.
(3) කණ්ඨජ, ඕෂ්ඨජ, දන්තජ හා මූර්ධජ ය. (4) මූර්ධජ, කණ්ඨජ හා දන්තජ ය.

11 අනුක්ත නාම පද තුනක් හා උක්ත නාම පදයක් ඇති වරණය තෝරන්න.
(1) දරුවෙකු, කාන්තාවක්, මා, තොප
(2) තොපි, අහිංසකයෝ, දරුවන්, මගීන්
(3) නාට්‍යාංනාවක, මහල්ලෙකු, ශිල්පීන්, ඔවුන්
(4) විනිශ්චකාරතුමා, දරුවෙක්, මැහැල්ලියක්, තා

12 'නටමින්' යන ක්‍රියාපදයේ 'නට' යනු,
(1) නිපාතයකි. (2) ප්‍රත්‍යයකි. (3) ධාතු ප්‍රකෘතියකි. (4) නාමයකි.

13 'ගුරුළුගෝමීන් විසින් පොළොන්නරු යුගයේ දී අමාවතුර ලියන ලදී.' යන වාක්‍යයෙහි උක්තය වනුයේ,
(1) පොළොන්නරු යුගයේ ය. (2) ගුරුළුගෝමීන් ය.
(3) අමාවතුර ය. (4) ගුරුළු ගෝමීන් විසින් ය.

14 මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) මිශ්‍ර ක්‍රියා - සොයමින්, බල බලා, නටමින්, දැක දැක
(2) ඌෂ්මාක්ෂර - (අ)ඃ, ස, හ, ය
(3) නිපාත - ද, මෙන්, සේ, වගේ
(4) උපසර්ග - නි, අව, උප, කු

- **අංක 15, 16, 17 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.**

15 කෙටි කතාවක් නිර්මාණය කිරීම **ආකස්මිකව** කළ හැකි දෙයක් නොව සතතාභ්‍යාසය තුළින් කළ හැක්කකි,
(1) අත්දැකීම් රහිතව (2) හේතුවක් නැතිව
(3) නිරන්තර අභ්‍යාස සහිතව (4) පරිකල්පනය සහිතව

16 භාෂාව පිළිබඳ ඔහු සතු **හසළත්වය** එම කෙටි කතාව කියවීමෙන් මනාව පැහැදිලි වේ.
(1) නිපුණ බව (2) පළපුරුද්ද (3) දියුණු බව (4) පුදුම සහගත බව

17 ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා සේවයට කැප වූ ගුරු පරපුරක් බිහි කිරීමෙහි ලා **පුරෝගාමී** විය.
(1) ඉදිරිපත් විය. (2) මුල් විය. (3) උද්‍යෝගිමත් විය. (4) උත්සාහ විය.

18 ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය කුමක් ද?
(1) ඇමතිතුමා නියෝග පනවයි. (2) කපටි නරියා හාවා රවටයි.
(3) ගුරුවරයා ශිෂ්‍යයෙකු නටවයි. (4) ඔහු ගී ගයා වේදිකාවෙන් බැස ගියේ ය.

19 එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) වියළි - ශුෂ්ක, කුම්භය - කළගෙඩිය, වත - වස්ත්‍රය, සිඳු - ගංගාව
(2) උවම් - උපමා, කෞශල්‍ය - කුසලතා, ඉසිඹු - විශ්‍රාම, ආහාර - එළවළු
(3) පරිශීලනය - හැදෑරීම, උක්තීන් - කියමන්, පිල්බර - මොනර, සව් - සියලු
(4) රෝදය - චක්‍රය, විකසිත - මුකුලිත, විහඟ - කුරුලු, තරිඳු - දිනිඳු

20 විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) ආචාර - අනාචාර (2) ආගන්තුක - නේවාසික
(3) ප්‍රබල - දුබල (4) රක්ෂිත - සුරක්ෂිත

21 දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) වාලුකාංගණ, බෝධිසර, පටිමාසර, චෛතියසර
(2) බක්කම්මා, මහම්මා, කුඩප්පච්චි, ලොකුතාත්තා
(3) කොස්ස, ඉදල, රේක්කය, දෙබල
(4) වාච්‍යාර්ථය, ධ්වනිතාර්ථය, පරිකල්පනය, න්‍යාය

22 වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'ය' ලිවීමට පෙර අක්ෂරයේ දීර්ඝත්ව සලකුණ යෙදිය හැක.
(2) ෂ, ණ, ර මූර්ධජ අක්ෂර ගණයට ගැනේ.
(3) වර්ගාන්ත අක්ෂර අනුනාසික්‍ය අක්ෂර ලෙස ද හඳුන්වයි.
(4) කරද්දී යන්න කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි.

23 සුන්දර+ඊය යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක්වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) සුන්දරීය. (2) සුන්දර ය. (3) සෞන්දරී ය. (4) සෞන්දර්යය.

24 දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි නාට්‍ය නාමය හඳුන්වන්න,
(1) තත්‍රංත (2) හසිහුංබා (3) බරිනැනා (4) ලල්ලවෙහුං

25 පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) අන්තර්ගත කෘතියකි බුත්සරණ නව අරහාදී බුදුගුණ සියල්ලක් ම.
(2) නිදහස් අදහස් ප්‍රකාශ කිරීම, ජනිත කිරීම ස්වාධීන දේශයක් පමණි.
(3) සියල්ල එක්තැන්වන කලා මාධ්‍යයකි නාට්‍ය කලාව, එනම් කාව්‍ය, ගීතය හා චිත්‍රය.
(4) විශේෂාංග ලිපියක් එහි අන්තර්ගත කරුණු සම්බන්ධ සෑම පාර්ශවයක් ම ආවරණය කරමින් සම්පාදනය කරන ලද්දක් විය යුතු ය.

- **අංක 26, 27, 28 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

26 යම් අරමුණකින් තොරව කටයුතු කිරීම,
(1) වක්කඩේ හකුරු හැංගුවා වගේ. (2) කළුවා මාරපන් ගියා වගේ.
(3) දී කිරට බළල්ලුත් සාක්ෂි. (4) විද්දෙ හාවට වැදුණෙ පඳුරට.

27 අසීරු අවස්ථාවේ උපකාර කළ අය නොසලකා හැරීම.
(1) දී කිරට බළල්ලුත් සාක්ෂි. (2) තැටිය රත්වුණු විට රොටිය පුච්චා ගැනීම.
(3) අව්ව තිබෙන විට පිදුරු වේලා ගැනීම. (4) වහලෙට නැගි ඉනිමඟට පයින් ගැසීම.

28 කෙනෙකුට තමා නුරුස්සන පුද්ගලයකු හමුවීම,
(1) උඩින් මිතුරු යටින් හතුරු. (2) කලකදි වහලු කලක දි රස වෙනවා ලූ.
(3) නයාට අඳුකොළ වගේ. (4) එපා වාහෙට හොඳි බෙදන්නා වගේ.

29 පහත උද්ධෘත අදාළ පාඩම් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
A ඉහළ ම පේසාව 'කුබ්ජ වේදිකා භූමිය' යි නම් විය.
B මා වඩාත් භාග්‍ය සම්පන්න වූයේ මා හිමියන්ගේ ම මූලිකත්වය යටතේ මාගේ අධ්‍යාපන කටයුතු ද ඒ වකවානුවේ ම ආරම්භ වූ හෙයිනි.
C ''මේ මිනිස්සු තමයි මහ පොළොවේ නියම පුත්තු''
D ''උඹට හුඟක් හයිය තියෙනවා නේ, ළමයෝ''
(1) ආරාමයේ නිර්මාණ, ආචාර්ය ටී.බී. ඡායා, තොරොක්කෝව, කාව්‍ය නිර්මාණකරණය
(2) ආරාමයේ නිර්මාණ, අතීතයෙන් කතාවක්, මං තනන්නෝ, තොරොක්කෝව
(3) පැරණි ජීවනෝපාය ක්‍රම හා බැඳුණු සිරිත් විරිත්, අතීතයෙන් කතාවක්, ආචාර්ය ටී.බී. ඡායා, තොරොක්කෝව
(4) පැරණි ජීවනෝපාය ක්‍රම හා බැඳුණු සිරිත් විරිත්, බසින් රස මවන සාහිත්‍යය, තොරොක්කෝව, මං තනන්නෝ

- **අංක 30, 31, 32 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

30 (1) ඔවුන් නිතිපතා පන්සිල් සුරකින බෞද්ධයන් වෙති.
(2) ඕ තොමෝ නින්දට යාමට පෙර තම දෙමව්පියන් වැන්දෝ ය.
(3) දරුවන් නිතිපතා තම වගකීම් ඉටු කළ යුත්තෝ ය.
(4) සියලු උසස්පෙළ සිසුන් රැස්වීම සඳහා සහභාගි විය යුතුය.

31 (1) රෝගීහු රෝහලේ නැවතී ප්‍රතිකාර ලබා ඇත.
(2) දුටුගැමුණු රජතුමා රට දැහැමින් පාලනය කළ ධර්මිෂ්ඨ රජකෙනෙක් ලූ.
(3) අපි නීතිගරුක පුද්ගලයෝ වන්නේ කවදා ද?
(4) තොප උදෙන් ම පාසලේ ක්‍රීඩාංගණයට ගියෙහු.

32 (1) අභය භූමියේ දී සංචාරකයින් විසින් සත්තු නරඹන ලදහ.
(2) අපේ පන්තිය අසළ තබා තිබූ මල් පෝච්චි යමෙක් විසින් සොරාගෙන ඇත.
(3) බුද්ධිමත් ගුරුවරියක සාහිත්‍ය නිර්මාණ කෙරෙහි අප යොමු කළහ.
(4) පියුම්හු උදෙන් ම විකසිත වෙයි.

33
- විශාල නියඟය .................. කෙත්වතු නිසරු විය.
- ඇය එම අවස්ථාවේ දැරියක .................. රඟපෑවා ය.
- රට ජාතිය බේරාගැනීම .................. සියලු ජනයා ක්‍රියා කළ යුතු බව සේනාධිපති ප්‍රකාශ කළේ ය.
- තම ඥාතියා සිහිවීම .................. ස්මාරක ය සෑදූව බව ගෙහිමියා කීවේ ය.

(1) නිසා, සේ, සඳහා, පිණිස (2) සේ, පිණිස, සඳහා, නිසා
(3) නිසා, සඳහා, පිණිස, සේ (4) නිසා, සඳහා, සේ, පිණිස

34 'දූන ගැනීමට අත්‍යවශ්‍ය ම කාරණයක් ! හ්ම්, දූන් කියනු අර රුධිරය ගැන කතාව..... හුණුවටයේ කතාව නාට්‍යයේ ඇතුළත් මෙය ප්‍රකාශ කරන ලද්දේ,

(1) අසඩක් ය. (2) 1 වන නීතිඥයා ය. (3) නටාලියා ය. (4) සයිමන් ය.

35 නන්නාඳුනන මෙනුවර තනි වුණ අපට
ඉන්නේ කවුද රැකවරණෙට බැල්මකට
චන්දෝ බිලින්දෝ නාඩා නැළවෙන්න
යම්දෝ හෙට උදේ අපි ආපසු ගමට

යන කවිය අයත් නිර්මාණයේ රචකයා වන්නේ,

(1) ඒ.වී. සූරවීර ය. (2) මහගම සේකර ය. (3) විමල් දිසානායක ය. (4) රත්න ශ්‍රී විජේසිංහ ය.

36 පහත සඳහන් කවියේ තුන්වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

පෙර විරුවන් ඔබගෙ පුතේ
ඉදි කළ වැව් බලන් පුතේ
..................................................................
ඒ මහ වැව් බැඳුණෙ පුතේ

(1) සුරු විරුකම ඔබට ඇතේ (2) දැතේ සවියෙනුයි පුතේ
(3) පියකරු බව ඇතත් පුතේ (4) දහදිය නොම සැලෙන ගතේ

37 පුරාණ ලංකාවේ ''හේන් ඇල්ලීම'' යනුවෙන් අදහස් කරන්නේ,

(1) හේන සඳහා අවශ්‍ය උපකරණ සොයා ගැනීමයි.
(2) හේන වැඩ කිරීමට පෙර තෝරා ගත් පඳුරකට වැදීමයි.
(3) ගොවියා හේනෙහි වැඩ ආරම්භ කිරීමයි.
(4) ගොවියා හේන සඳහා සුබ දිනයක් තෝරා ගැනීමයි.

38 පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

''අපි ඒ දරුවොත් එක්ක උදේ රැයින් ම පිටත් වුණා.''

(1) අපි එම දරුවන් සමඟ උදේ හා රාත්‍රියේ පිටත් වුණෙමු.
(2) අපි එම දරුවන් සමඟ උදෙන්ම පිටත් වුණෙමු.
(3) අප දරුවොත් සමඟ උදේ පාන්දරම පිටත් වුණි.
(4) අපි ඒ දරුවෝ එක්ක උදෙන් ම ගියෙමු.

39 මොනරාගල පෙදෙසෙහි ''කුදහන්නැතුං වරෙල්ලා'' යනුවෙන් අදහස් කරන්නේ,

(1) පමා නො වී ආ යුතු බව පැවසීමට ය.
(2) නිදාගන්නෙ නැතිව සිටිය යුතු බව පැවසීමට ය.
(3) නිදාගැනීමට ප්‍රමාද නොවිය යුතු බව පැවසීමට ය.
(4) පමා නොවී නිදාගත යුතු බව පැවසීමට ය.

40 වැව මඟින් බුදුන් වහන්සේ විසින් අනුදක්නා ලද නිරවද්‍ය ජීවනෝපායක් වූ කෘෂිකර්මාන්තයට අවශ්‍ය දියවර ප්‍රදානය කෙරුණු අතර, වැව් ඉස්මත්තේ වූ දාගැබ් සදාචාර සම්පන්න ජන සමාජයකට අවශ්‍ය බෞද්ධ වටපිටාව නිර්මාණය කර දුන්නේ ය.

(1) කෘෂි කර්මාන්තයට අවශ්‍ය දියවර වැව තුළින් ලබාදුන් අතර සදාචාර සම්පන්න ජන ජීවිතයක් බුදුන් වහන්සේ අනුදක්වන ලදී.
(2) බුදුන් වහන්සේ විසින් අනුදක්නා කෘෂිකර්මාන්තයට වැව්වලින් ජලය ලබාදුන්නා සේ ම දාගැබ තුළින් සදාචාර සම්පන්න ජන සමාජයකට සුදුසු වටපිටාවක් නිර්මාණය විණි.
(3) වැව මඟින් බුදුන් වහන්සේ අනුදක්නා කෘෂිකර්මාන්තයත් දාගැබ තුළින් සදාචාර සම්පන්න ජන සමාජයක් පිළිබිඹු කළේ ය.
(4) වැව මඟින් බුදුන්වහන්සේ අනුදක්නා කෘෂි කර්මාන්තයත් බෞද්ධ වටපිටාවක් නිර්මාණය කිරීමට දාගැබත් ජනතාවට උපකාරී විය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

- **අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) (i) අනුස්වාරය යෙදුන වචනයක් හා විසර්ගය යෙදුන වචනයක් ලියන්න.

(ii) පහත වචනවල අක්ෂර වින්‍යාසය වැරදිය. එය නිවැරදි කර ලියන්න.
(අ) සමස්ථ (ආ) ශබ්දෝඡ්චාරණ

(iii) පහත දැක්වෙන ක්‍රියාපදවල ප්‍රකෘති වෙන් කොට දක්වන්න.
(අ) බලයි (ආ) ලියයි

(iv) පහත දැක්වෙන වාක්‍ය වැරදි නම් නිවැරදි කර ලියන්න.
(අ) ඕ තොමෝ ආදරයෙන් තම දරුවන් රකිති.
(ආ) ඔවුහු තරගයට ඉදිරිපත් වන්නේ කෙසේ ද?

(v) පහත දැක්වෙන වැකිවල **තද කළු අකුරෙන්** දක්වා ඇති වචන අයත් ක්‍රියාවර්ගය නම් කරන්න.
(අ) උපාසිකාව පහන **දල්වා** විහාරයට ගියාය.
(ආ) ගුරුවරයා ශිෂ්‍යයා ලවා අකුරු **ලියවයි**.

(vi) පහත දැක්වෙන වාක්‍යයෙහි උපමා උපමේය වෙන් කොට දක්වන්න.
''හී කොනේ බඳින ලද තල් පතක් වූ හෙයින් තමනට අනතුරු කරන මාරයකු මෙන් නොව සන්දේශයක් ගෙනෙන දූතයකු මෙන් පැමිණි ඒ හීය දෙස.....''

(vii) පහත දැක්වෙන උක්ත පදවලට ගැළපෙන අනුක්ත රූප ලියා දක්වන්න.
(අ) වලස්සු (ආ) එළදෙනක්

(viii) පහත දැක්වෙන අර්ථ දීමට සුදුසු ප්‍රස්තාව පිරුළු ලියන්න.
(අ) වාසි පැත්තට කවුරුත් හිතවත්ව කතා කිරීම.
(ආ) අධමයන්ට උතුම් දෙයින් පලක් නැති බව.

(ix) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) පොලිස් භටයෙක් සොරකු ලුහුබඳියි. (ආ) ඔවුහු අප සුහදව පිළිගත්හ.

(x) පහත දැක්වෙන වචනවල පොදු ව්‍යවහාර දක්වන්න.
(අ) පුන්නච්චා (ආ) ඉඟුරු

(ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) වර්තමාන සමාජ මාධ්‍ය ඉතා වේගයෙන් සමාජය ආක්‍රමණය කොට ඇත. මේවායින් ලබාගත හැකි ප්‍රයෝජන බොහෝ ය. නමුත් මේවාට ඇබ්බැහි වීමත් අවබෝධයෙන් තොරව පරිහරණය කිරීමත් හේතුවෙන් පුද්ගලයා විවිධ අපහසුතා හා ව්‍යවසනයන්ට පත්වේ. මේ නිසා සමාජ මාධ්‍ය පිළිබඳ පාලනයක් අවශ්‍යය. (ලකුණු 25)

(ආ) වැඩිවන ජනගහනයට ප්‍රමාණවත් ආහාර සැපයීම ගැටලුවක් බවට පත් වී ඇත. අනාගත මිනිසාගේ පැවැත්මට හා වර්ධනයට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ කෘත්‍රිම ආහාර මගින් හෝ ලබා දීමට සිදුවන දිනය අත ළඟට ම පැමිණ ඇත. මෙහිලා පැන නැගිය හැකි අහිතකර ලක්‍ෂණ බැහැර කොට නව ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම පෝෂණ විද්‍යාඥයින්ගේ වගකීමකි. (ලකුණු 25)

(ඉ) යුද්ධයේ කුරිරුකම ගැනත් සාමයේ වැදගත්කම ගැනත් අපි මේ දිනවල බෙහෙවින් කතා කරමු. යුද්ධය නිසා සියදහස් ගණන් ජීවිත ප්‍රකෝටි ගණනක ධනය විනාශ වේ. වෛරය ක්‍රෝධය වැනි අහිතකර සිතුවිලිවලට මිනිස් සිත නැඹුරු වෙමින් පවතී. යුද මානසිකත්වය අකාමකා දැමීම සඳහා මුල් පියවර දැමිය යුත්තේ අධ්‍යාපනය මගිනි. (ලකුණු 25)

(ඊ) වෙරළාසන්න පරිසර දූෂණය අතින් ශ්‍රී ලංකාව පස්වන ස්ථානයේ පවතින බව පසුගියදා පුවත්පත් වාර්තාවක පළ වී තිබිණි. මෙරටට විදේශ විනිමය උපයා ගැනෙන ප්‍රධාන ක්‍රමවේදයක් වන සංචාරක ව්‍යාපාරය මෙන් ම විශේෂයෙන්ම වෙරළාසන්න ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ සෞඛ්‍යය කෙරෙහි ද අහිතකරව බලපාන වෙරළාසන්න පරිසර දූෂණය වළක්වා ගැනීමේ ක්‍රමෝපාය කෙරෙහි අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවයකි.

(ලකුණු 25)

(03) පහත සඳහන් ඡේදය වචන 50-60 අතර ප්‍රමාණයකින් සාරාංශ කරන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

සංස්කෘතිය යනු යම් ජන කොට්ඨාසයක් නැත්නම් ජාතියක් විසින් අනාදිමත් කාලයක් තිස්සේ එක් රැස් කර ගන්නා ලද සිරිත් විරිත් ඇදහිලි විශ්වාස ඇවැතුම් පැවැතුම් හෙවත් ඒ ජාතියට ම සුවිශේෂ වූ ජන විඥානය යි; චින්තනය යි. ජාතියක් ලෝකය දෙස බලන්නෙත් ඒ ලෝකය ග්‍රහණය කර ගන්නෙත්, හැසිරෙන්නෙත්, ක්‍රියාකරන්නෙත් මේ සුවිශේෂ වූ ජනවිඥානයේ නැතිනම් චින්තනය අනුව ය. ජාතියක් යනු සංස්කෘතිකමය නිර්මාණයකි. පුද්ගලික මනසේ සිට ජාතික මනස දක්වා පැතිර පවත්නා මේ ජාතික විඥානය සහ සංස්කෘතිය අඛණ්ඩව ගලායන්නකි. ඒ අතර ම එය නො වෙනස් වෙමින් වෙනස් වන්නකි. සංස්කෘතියක් පාෂාණීභූත නොවී සිය සජීවී භාවය රැක ගනිමින් නොසිඳී ගලායන්නේ මේ කාලානුරූප වෙනස්වීම නිසයි. මෙරට සිටින බටහිර ගැතියෙකුට වුව ද සංස්කෘතියෙන් සම්පූර්ණයෙන් ම මිදී කටයුතු කළ නො හැකි ය. එසේ ම යම් යම් කාලපරිච්ඡේදවල දී බටහිර සංස්කෘතික ආක්‍රමණ මගින් නිජබිමත් සංස්කෘතියත් යටපත් කිරීමට තැත් කළ ද ඒ සංස්කෘතියේ වාහකයන් වන ජාතියක් සතු භාෂාව හා ආගම රැකී ඇත්නම් ඒ නිජබිමෙහි සංස්කෘතිය සහමුලින් ම වනසා දැමීමට නොහැකිය.

(ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිසාට සුව පහසු ජීවිතයක් ගත කිරීම සඳහාත් ඔහුගේ භෞතික සංවර්ධනය සඳහාත් ජීවනෝපායක් තිබිය යුතු බැවින් සෑම රටක් ම වැඩ කළ හැකි සියලු දෙනාට රැකියා සැපයීමේ වග කීමෙන් ද බැඳී සිටී. එහෙත් රැකියා වෙළෙඳපොළට පිවිසෙන සියල්ලන්ට ම රැකියා සැපයීමට සංවර්ධනය වූ රටවල් පවා තවමත් සමත් වී නැත. විරැකියාව බොහෝ රටවල් මුහුණපාන ප්‍රධාන ගැටලුවක් වී ඇත්තේ එබැවිනි. තවත් අතකින් බලනවිට පෙනී යනුයේ සෑමට රැකියා සැපයීම රජයට ම කළ නොහැකි දෙයක් බවයි. මෙහිදී රජය මගින් කළයුත්තේ කවර තරාතිරමේ හෝ රැකියා සුලබ කෙරෙන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් සකස්කොට ඒවා ක්‍රියාවට නැංවීමට ය. ඒ අනුව සෑම පුරවැසියෙකුට ම තම හැකියා හා අධ්‍යාපන මට්ටම් අනුව කළ හැකි සුදුසු රැකියා රටක් තුළ උත්පාදනය විය යුතු ය. එසේ නොකොට මිනිස් ශ්‍රමය අපතේ හැරීම හෝ අවතක්සේරු කිරීම හෝ සදාචාරාත්මක වශයෙන් කිසිසේත් සාධාරණ නැත. කෙසේ වූ ව ද මිනිසාගේ ආර්ථික ප්‍රශ්න දිගින් දිගටම නොවිසිඳි පැවැතුන හොත් සමාජ සදාචාරය දෙදරා ගොස් රටක අවුල් වියවුල් පැන නැගීම නොවැළැක්විය හැකි ය. එබැවින් ආර්ථික ගැටලු විසඳීමේ දී වඩාත් ඵලදායී වන්නේ ආර්ථිකය මනුෂ්‍ය ජීවිතය කෙරෙහි ඇති කරවන විවිධ බලපෑම් සමතයකට පත්කොට මිනිසා ආර්ථිකයෙහි වහලෙකු නොකොට ආර්ථික බලවේග වහල් කොට ගෙන ජීවිතය හැඩ ගස්වා ගන්නෙකු බවට පත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමයි.

(i) මිනිසාට රැකියාවක අවශ්‍යතාවය දැනෙන්නේ කවර හේතුවක් නිසා ද?
(ii) රැකියා සැපයීම සම්බන්ධයෙන් රජයට ඉදිරිපත් කළ හැකි යෝග්‍ය විසඳුම කුමක් ද?
(iii) මිනිසා ආර්ථික වශයෙන් වහලෙකු නොවීමට නම් කුමක් සිදුවිය යුතු ද?
(iv) සදාචාරාත්මක වශයෙන් සාධාරණ නොවන දේ ලෙස මෙහි දක්වා ඇති කරුණු දෙක මොනවා ද?
(v) බොහෝ රටවල් මුහුණපාන ප්‍රධාන ගැටලුව වී ඇත්තේ කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

(05) ඔබේ පාසලේ පැවැත්වෙන අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගී වන මෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. කලා සංගමයේ ලේකම් විශ්වනාත් ගුරුසිංහ ඔබ යැයි සිතන්න. අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා සුදුසු නමක් ද යොදන්න. (ලකුණු 15)

**නැතහොත්**

පහත සඳහන් විස්තරය පදනම් කරගෙන රාජකාරී ලිපියක් සකස් කරන්න.

- සුබෝධිගම ග්‍රාම සංවර්ධන සමිතියේ වාර්ෂික මහා රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡාවට භාජනය විය.
    - සුබෝධිගම ගම මැදින් වැටී ඇති දුම්රිය හරස්මාර්ගය අනතුරු බහුල ස්ථානයක් වී ඇති බව.
    - දුම්රිය ගේට්ටුවක් නොමැතිකම මීට ප්‍රධාන හේතුව වී ඇති බව.
    - මේ වනවිටත් ජීවිත හානි කීපයක් ම සිදුව ඇති බව.
    - දුම්රිය ගේට්ටුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දුම්රිය අධිකාරීවරයාගෙන් ඉල්ලීමක් කළ යුතු බව, සුබෝධිගම ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් 'වසන්ත දිසානායක' ඔබ යැයි සිතන්න. (වචන 100 ක් පමණ සෑහේ)

(ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**10 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) ''විලේජ් ඉන් ද ජන්ගල්'' නවකතාවේ කතුවරයා කවුරුන් ද?
(ආ) ඉහත නව කතාව ලියවුණ වර්ෂය කුමක් ද?

(ii) (අ) බලි තොවිල් හා ශාන්ති කර්මවල දී ජනයා දෙවියන් උදෙසා ගායනා කළ කාව්‍ය වර්ග 02 ක නම් ලියන්න.
(ආ) ජන ක්‍රීඩා ආශ්‍රයෙන් බිහි වූ ජන කවි වර්ග දෙකක් සඳහන් කරන්න.

(iii) (අ) පන්සිය පනස් ජාතක පොත ලියවුණු සියවස සඳහන් කරන්න.
(ආ) ජාතක කතාවන්ට නියමිත ආකෘතියේ ලක්ෂණ දෙකක් ලියන්න.

(iv) (අ) ගුත්තිල කාව්‍යයේ ඇතුළත් මුළු පද්‍ය ගණන කීයද?
(ආ) ගුත්තිල කාව්‍යයේ පළමු කවිය අයත් කාව්‍ය ගණය කුමක් ද?

(v) ''ඇයි මෝඩියේ මොකක් ද ඒ මිනිහට කියපු නම''
(අ) මේ ප්‍රකාශය කරන්නේ කවුරුන් ද?
(ආ) මෝඩියේ යනුවෙන් ඇමතුම් ලැබූයේ කවුරුන් ද?

(vi) පහත කවියෙහි ඉතිරි පද සම්පූර්ණ කරන්න.

වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ

(අ) ..........................................................................
(ආ) ..........................................................................

(vii) (අ) පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍ර වූ ග්‍රන්ථය කුමක් ද?
(ආ) ගුත්තිල කාව්‍යට පාදක වූ ජාතක කතාව කුමක් ද?

(viii) ''නැගී සිටුව ආචාරිනී මා නො වඳුව''
(අ) මේ ප්‍රකාශය කළේ කවුරුන් ද?
(ආ) මෙහි සඳහන් ආචාරීන්ගේ නම කුමක් ද?

(ix) පහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.

පියසන් නොව බිඟු දූල් රැඳී කොපුලී
අවසන් නොව වෙණ නදට ම කුහුලී

(අ) ..........................................................................
(ආ) ..........................................................................

(x) (අ) සුදු ගෝනා කාගේ පරිවර්තන කෘතියක් ද?
(ආ) ''හානා හීය පානා අඬහැරෙන් දූනේ'' පාඩමේ ඇතුළත් කවි අයත්වන්නේ කුමන ජන කවි වර්ගයට ද?

(ලකුණු $2 \times 10 = 20$)

(02) පහත දක්වෙන ගද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''මෙසේ එව දරුව, තොප අත තුබූ සාල් නැළියත් බත් මුළත් මසු දහසත් තුන පිළිවෙළින් බිම තබාලව''
(අ) මේ කවුරුන් කා හට කළ ප්‍රකාශයක් ද?
(ආ) මෙසේ කීමට හේතුව කෙටියෙන් ලියන්න.

(ii) **රන් විමනේ** සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩගිනි නැද්ද
**මිණි බරණින්** සැදු මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) මේ කවියෙන් කියවෙන උපදේශය කුමක් ද?

(iii) ''රජ්ජුරුවන්ගේ සිත් නැමති ආකාශ ගංගායෙහි බිඳී බිඳී දිවෙන්නා වූ රළපතර සේ යුද්ධයට පිඹිනා ලද **කාහල** ශබ්දයෙන් සතුටු වැ පැන - පැන සිටිනා වූ ග්‍රීවය ගසා සිටුවන ලද්දා වූ අස්වළල්ලකින් ද.''

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත විස්තර වන අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
**රුති** ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ
පැතිරෙන වෙණ නඳ බැඳුණු සිතැත්තෝ
අතිනවි ගිලිහෙන බව නොම දත්තෝ

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) පසුව මුලු කවියේ ම අර්ථය ලියන්න.

(v) ''අවතාර **අඩ්කෝඩවලින්** පිරුණේ යයි ද ප්‍රසිද්ධව ගිය මේ ගෙයි වාසයට ඒමට තරම් **සැහැසි** වූ කිසිවෙක් ගමේ නොවූහ.''

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) මෙහි විස්තර වන අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ලකුණු 4 x 5 = 20)

(03) (i) අර්ථ රසයත්,
(ii) ශබ්ද රසයත් මැනවින් යොදාගත් කාව්‍යයක් ලෙස ගුත්තිල කාව්‍ය හැඳින්විය හැකිය. නියමිත කවිවලින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) මහෞෂධ පණ්ඩිතයන්ගේ පරාර්ථකාමී බවත්,
(ii) කේවට්ට බමුණාගේ ස්වාර්ථකාමී බවත් උම්මග්ග ජාතකයෙන් ගම්‍ය වේ. නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

(ලකුණු 15)

(04) (i) සරල භාෂා භාවිතයත්,
(ii) ජීවිතයට උපදේශ සැපයීමත්, උපදේශ කවිවල කැපී පෙනෙන ලක්ෂණ වේ. නියමිත කවිවලින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) ගැමියන්ගේ නූගත්කම පිළිබඳවත්,
(ii) කැලෑබත් වන ගමක් පිළිබඳවත්, බැද්දේගම නවකතාවෙන් කියවේ. නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන විස්තර කරන්න.

(ලකුණු 15)

(05) මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥාවේ මහිමයෙන් මියුලුනුවර ආරක්ෂා වූ අයුරු උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(06) ගුත්තිල ඇඳුරුතුමා විශිෂ්ට වීණා ශිල්පියෙක් බව නියමිත කවිවලින් උදාහරණ තුනක් ගෙන පහදන්න.

(ලකුණු 10)

(07) ''හානා හීය පානා අඬහැරෙන් දූනේ'' පාඩම ඇසුරෙන් උපදේශාත්මක ජනකවිවල ඇති ජනකවි ලක්ෂණ තුනක් විස්තර කරන්න.

(ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (2) | 11 - (1) | 21 - (4) | 31 - (2) |
| 2 - (4) | 12 - (3) | 22 - (1) | 32 - (1) |
| 3 - (1) | 13 - (3) | 23 - (4) | 33 - (1) |
| 4 - (4) | 14 - (2) | 24 - (2) | 34 - (1) |
| 5 - (2) | 15 - (2) | 25 - (4) | 35 - (4) |
| 6 - (3) | 16 - (1) | 26 - (2) | 36 - (2) |
| 7 - (3) | 17 - (2) | 27 - (4) | 37 - (3) |
| 8 - (2) | 18 - (3) | 28 - (3) | 38 - (2) |
| 9 - (4) | 19 - (3) | 29 - (2) | 39 - (1) |
| 10 - (3) | 20 - (4) | 30 - (4) | 40 - (2) |

## II කොටස

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

01 (I) (අ) සංවාදය, සංඛ්‍යාව (ආ) මනඃකල්පිත, දුඃඛදායක..... වැනි,
(ii) (අ) සමස්ත (ආ) ශබ්දෝච්චාරණ
(iii) (අ) බල (ආ) ලිය
(iv) (අ) ඕ තොමෝ ආදරයෙන් දරුවන් රකියි. (ආ) ඔවුන් තරගයට ඉදිරිපත් වන්නේ කෙසේ ද?
(v) (අ) පූර්ව ක්‍රියා (ආ) ප්‍රයෝජ්‍ය ක්‍රියා
(vi) (අ) උපමා : අනතුරු කරන මාරයෙකු මෙන් නොව සංදේශයක් ගෙනෙන දූතයකු වේ.
(ආ) උපමේය : හී කොනේ බඳින ලද තල්පත
(vii) (අ) වලස්සු - වලසුන් (ආ) එළදෙනක් - එළදෙනක
(viii) (අ) දී කිරට බළල්ලුත් සාක්කි ලූ. (ආ) ඌරෝ කවද්ද කහ කෑවේ.
(ix) (අ) පොලිස් භටයෙකු විසින් සොරෙක් ලුහුබඳිනු ලබයි. / ලුහු බැඳෙයි.
(ආ) ඔවුන් විසින් අපි සුහදව පිළිගනු ලැබීමු. / පිළිගැනෙමු.
(x) (අ) නිදි කරනවා (ආ) ඉරිඟු (බඩඉරිඟු)

02
- සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව ලකුණු 08
- සංවිධානය, නිර්මාණාත්මභාවය හා ස්වීයත්වය ලකුණු 12
- ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා බෙදීම ලකුණු 05

මුළු ලකුණු 25 යි.

03 සාරාංශය :
සංස්කෘතිය යනු යම් ජාතියකට සුවිශේෂ වූ විඥානය යි. චින්තනයයි. ජාතියක දැක්ම මේ විඥානය මත රඳාපවතියි. නො වෙනස් වෙමින් වෙනස්වන සංස්කෘතිය අඛණ්ඩව ගලා යන බැවින් සජීවී කාලානුරූප බවක් ගනී. කෙනෙකුට සම්පූර්ණයෙන් සංස්කෘතියෙන් මිදිය නොහැකිය. භාෂාව හා ආගම රැකී ඇත්නම් බාහිර සංස්කෘතීන්ට නිජබිමෙහි සංස්කෘතියක් මුළුමනින්ම යටපත් කළ නොහැකිය. (වචන 52)

ලකුණු විග්‍රහය
1. අන්තර්ගතය (ප්‍රධාන අදහස් සඳහා) - ලකුණු 06
2. වචන ගණන - ලකුණු 02
3. ශිල්පීය දක්‍ෂතා - ලකුණු 02

04 (i) සුවපහසු ජීවිතයක් ගත කිරීම සඳහා / ජීවත්වීම සඳහා සෑම කෙනෙකුටම රැකියාවක් තිබිය යුතු බැවිනි.
(ii) කවර තරාතිරමේ හෝ රැකියා සුලබ කෙරෙන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් සකස්කර ක්‍රියාවට නැංවීම.
(iii) ආර්ථිකය මනුෂ්‍ය ජීවිතය කෙරෙහි ඇතිකරන බලපෑම සමතයකට පත්කොට ආර්ථික බලවේග වහල්කරගෙන ජීවිතය හැඩ ගස්වා ගන්නෙකු බවට පත් කිරීම / තමා ස්වාධීන පුද්ගලයෙකු යන අදහස පුද්ගලයා තුළ ජනිත කිරීම.
(iv) මිනිස් ශ්‍රමය අපතේ හැරීම හා මිනිස් ශ්‍රමය අවතක්සේරු කිරීම.
(v) විරැකියාව

(ල. 2x 5 = 10)

05 ප්‍රායෝගික ලේඛන
ආරාධනා පත්‍රය :

ආකෘතිය - ලකුණු 04
අන්තර්ගතය - ලකුණු 08
ශිල්පීය දක්‍ෂතා - ලකුණු 03
මුළු ලකුණු 15

ආරාධනා පත්‍රය :

ආකෘතිය - ලකුණු 04
අන්තර්ගතය - ලකුණු 08
ශිල්පීය දක්‍ෂතා - ලකුණු 03

මුළු ලකුණු 5 + 7 + 3 = 15

## III කොටස

01. (i) (අ) ලෙනාඩ් වුල්ෆ්
(ආ) 1913

(ii) (අ) ගම්මඩු කවි, දෙවොල්මඩු කවි, කෝල්මුර කවි
(ආ) ලී කෙළි කවි, රබන් කවි, ඔන්චිලිවාරම් ආදී

(iii) (අ) 14 වෙනි සියවස
(ආ) වර්තමාන කතාව, අතීත කතාව, සමෝධානය

(iv) (අ) 511 යි.
(ආ) වායු ගණය

(v) (අ) හිරපල්ලා
(ආ) පුංචි මැණිකා

(vi) (අ) වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ
(ආ) වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

(vii) (අ) පාලි ජාතකට්ඨ කතාව
(ආ) ගුත්තිල ජාතකය

(viii) (අ) මහෞෂධ පඬිතුමා
(ආ) කේවට්ට බමුණා

(ix) (අ) මද සන්සුන් පියොවින් සිටි නොසැලී
(ආ) ගජසෙන් සිතියම් ගජසිරි කියෙලි

(x) (අ) ඒ. පී. ගුණරත්න
(ආ) දැනමුතුකමට කී කවි හෙවත් උපදේශ කවි (ලකුණු 2 x 10 = 20)

02. (i) (අ) තලතා දේවිය විසින් ගගින් එතෙර වූ මගියාට
(ආ) එම මගියා විසින් තමාව එතෙර කළ පුද්ගලයාට ඔහු කැමති දේ නොදීම නිසා (යන අර්ථය මතුවන සේ ලියා තිබිය යුතුය.)

(ii) (අ) රත්තරන් මාළිගාව / රන් ගෘහය (යන අදහස)
සැදූ මුත් = සැරසුවත්
(ආ) අස්තිර බව / අනිත්‍යතාව

(iii) (අ) කාහළ = හොරණෑ
ග්‍රීවය = බෙල්ල
(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජුගේ සේනාව මියුලු නුවර වැටලූ අවස්ථාවේ අශ්ව සේනාව සත් යොදුන් මියුලු නුවර වටකර සිටි ආකාරය

(iv) (අ) රුති = කැමති
රුපුනොද - සතුරන්ගේ බලය / එඩිය
(ආ) නිරන්තරයෙන් රජුගේ ආරක්ෂාවේ යෙදී සිටියා වූද, කැමති පරදී සතුරන්ගේ බලය බිඳ ජය ගත්තා වූ ද පැතිරෙන වීණා නාදය කෙරෙහි, බැඳුණු සිත් ඇති (සොල්දාදුවන්) තම අතින් ආයුධ ගිලිහෙණ බව නොම දත්හ.

(v) (අ) අඩිකෝඩ = කෝලම් / කලබල / විකාර
(ආ) බබේහාමි ආච්චි මිය ගොස් නැංචොහාමි ගම හැර ගිය පසු ආරච්චි නිවස පාලු වී ඇති ආකාරය
(ලකුණු 4 x 5 = 20)

03, 04 ප්‍රශ්න සඳහා වූ ලකුණු පහළොව උදාහරණ සඳහා 4 න් ද, විචාරය සඳහා 11 න් ද පිරි නමන්න.

05 - 07 ප්‍රශ්න සඳහා වූ ලකුණු දහය උදාහරණ සඳහා 3 න් ද, විචාරය සඳහා 7 න් ද පිරි නමන්න.